MO-1
20 MAR 2017

නේවාසිකව්‍යාපෘතිකළමනාකරණ කාර්යාලය - මහවිලච්චිය
திவிட திட்ட முகாமையாளர் காரியாலையம்–மகவிலச்சிய
Resident Project Management Office –Mahawilachchiya

IMD

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
**Irrigation Management Division**
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශය
நீர்ப்பாசனம்மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
**Ministry of Irrigation& Water Resources Management**

මහවිලච්චිය
පේමඩුව
மகவிலச்சிய
பெமடுவ
Mahawilachchiya
Pemaduwa

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref No: 017/03/01 | ඔබේ අංකය / மது இல. / Your Ref No: | දිනය / திகதி / Date: 207-03-16 |

**දිස්ත්‍රික් ලේකම්,**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,**

**අනුරාධපුරය.**

<u>2017 යල පෙර කන්න රැස්වීමේ තීරණ දැනුම්දීම- මහවිලච්චිය ව්‍යාපාරය</u>

මහවිලච්චිය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ 2017 යල කන්නයේ වගා කටයුතු සැළසුම් කිරීම සඳහා පැවැත්වියුතු පෙර වගා රැස්වීම 2017.03.16 දින ව්‍යාපාරයේ ගොවි සංවිධාන නිළධාරින් හා රේඛීය රාජ්‍ය ආයතන වල සහභාගිත්වයෙන් යුතුව පැවැත්විණි.ඒ අනුව ඉදිරි යල කන්නයේ වගා කටයුතු සිදු කිරීමට සුදුසු බවට අනුමත කරගනු ලැබූ තීන්දු තීරණ පහත පරිදි ඉදිරිපත් කරනු ලබන අතර කන්න රැස්වීම පැවැත්වීම සඳහා දිනයක් ලබා දෙන මෙන් මෙයින් කාරුණිකව ඉල්ලා සිටිමි.

<u>2017යල පෙර කන්න රැස්වීමේ තීරණ.</u>

01. වගා කිරීමට අපේක්ෂිත බෝග වර්ගය - මාස 03,03
02. වගා කරන බිම් ප්‍රමාණය -අක්කර 2929
03. වාරි පහසුකම් සැපයීමට නියමිත ප්‍රමාණය - අක්කර 2664
04. වගාව ආරම්භය සඳහා ජලය නිකුත් කරන දිනය - 2017.04.25
05. වපුරා අවසන් කරන දිනය - 2017.05.16
06. මුර ජල ක්‍රමය ආරම්භ කරන දිනය - 2017.05.23
07. අවසන් වරට ජලය නිකුත් කිරීමට යොජිත දිනය - 2017.08.16
08. අස්වනු නෙලා අවසන් කරන දිනය - 2017.09.01
09. ගොවිසංවිධාන හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රධානඇල බෙදුම් ඇලවල් හා කෙත් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කල යුතු දිනය -2017.04.20
10. ගොවීන් විසින් නියමිත දිනට සුද්ද පවිත්‍ර නොකරනු ලබන ඇලවල් ගොවිසංවිධාන විසින් සුද්ද පවිත්‍ර කර අවසන් කල යුතු දිනය -2017.04.23
11. වගා රක්ෂණය කර අවසන් කල යුතු දිනය -2017.05.16
12. වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය -2017.09.01

➢ 1994 අංක 13 දරණ (සංශෝධිත)වාරිමාර්ග ආඥා පනත 11 උප වගන්තිය අනුව ඉදිරි කන්නය ක්‍රියාත්මක කිරීමසඳහා යෝජිත නීති රීති

I කෙත් ඇලවල් සහ බෙදුම් ඇලවල් වල නඩත්තුව සඳහා අක්කර 01 කට රු300.00ක මුදලක් ගොවිසංවිධානයට ගෙවිය යුතුය.එම මුදල වාරි පද්ධතියේ නඩත්තුවට පමණක් උපයෝගී කර ගත යුතුය.

II නියමිත දිනට බෙදුම් ඇලවල් සහ කෙත් ඇලවල් වල තම පංගු කොටස සුද්ධ පවිත්‍ර නොකරන ගොවීන්ගෙන්කෙත් ඇලකට බඹයකට රු100.00කද අපවහන ඇල බඹයකට රු200.00කද හා බෙදුම් ඇල බඹයකටරු200.00කද දඩමුදලක් අයකිරීම.

IIIපිදුරු පිළිස්සීම වෙනුවෙන් අක්කර 01 ක පිදුරු ගොඩකට රු 1000.00ක්ද අක්කරයක අතුරා ඇති විට රු2500.00ක දඩමුදලක් අය කිරීම .

IV අයාලේ යන ගවයින් සඳහාරු1000.00 දඩමුදලක් අයකිරීම හා බෝගයන්ට හෝ වාරිමාර්ග පද්ධතියට/ඇලවේලිහෝ නිර්මිත වලට හානි කල අවස්ථා වලදී අදාල ආයතනයේ ඇස්තමේන්තු ගත මුදල දඩයක් ලෙස ගව හිමියාගෙන් අය කිරීම.

V ගොවි ආරාධනයෙන් ශ්‍රම දායකත්වය අවශ්‍ය යැයි තීරණය කරනු ලබන ඕනෑම අවස්ථාවක සාමාජිකයා ශ්‍රම දායකත්වය ලබා දිය යුතුය. සාමාජිකයාගෙන් නියෝජිතයකු සහභාගී නොවන්නේ නම් ප්‍රදේශයේ දැනට පවතින දිනකට වැටුප වන රු.1200/- ක් ද වරුවකට රු.600/- ක් ද වශයෙන් ගොවිසංවිධානයට ගෙවිය යුතුය.

.........................................

එච්.එම්.එස්.බී.හේරත්

නේවාසික ව්‍යාපාර කළමනාකරු.

මහවිලච්චිය.

එච්.එම්.එස්.බී.හේරත්
නේවාසික ව්‍යාපාර කළමණාකරු
නේවාසික ව්‍යාපාර කළමණාකරණ කාර්යාලය
මහ විලච්චිය ව්‍යාපාරය
පේමඩුව.

පිටපත්-

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ - වාරිමාර්ග කළමනාකරණ අංශය | -කොළඹ | කා.දැ.ගැ.ස |
| වාරිමාර්ග අධ්‍යක්ෂ | -අනුරාධපුරය | |
| ප්‍රාදේශීය ලේකම් | -මහවිලච්චිය | |
| ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු | -අනුරාධපුරය | |
| ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් | -අනුරාධපුරය | |
| දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ | -අනුරාධපුරය | |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ,අන්තර් පළාත් | -අනුරාධපුරය | |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ,කෘෂි රක්ෂණ මණ්ඩලය | -අනුරාධපුරය | |